සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය
## පෙරදිග සංගීතය

**නම/විභාග අංකය :-- ..................................................................................................................... කාලය : පැය 02 යි.**

### I කොටස

● **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

1. බිලාවල් රාගයේ වාදී හා සංවාදී ස්වර දෙක පිළිවෙලින්,
   1. ධ ග වේ. 2. ග ධ වේ. 3. ග නි වේ. 4. ප ස් වේ.

2. භූපාලි රාගයේ වර්ජිත ස්වර ගණන,
   1. එකකි. 2. දෙකකි. 3. තුනකි. 4. හතරකි.

3. බොක්ස් ගිටාරයේ තත් සංඛ්‍යාව
   1. 4කි. 2. 6 කි. 3. 8 කි. 4. 10 කි.

4. ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතයේ ඉතා ජනප්‍රිය වූ ස්වර පුවරු භාණ්ඩය වන්නේ මින් කුමක් ද?
   1. හාර්මෝනියම් 2. පියානෝව 3. විදුලි ඕගනය 4. එකෝඩියනය

5. මේ අතරින් මා පිය ගුණ වර්ණනා ගීතයන්ට අයත් නොවන්නේ,
   1. කරුණාව සමග හොඳ හිත 3. අම්මා සඳකි
   3. ආදරයේ උල්පත වූ අම්මා 4. දවසක් පැල නැති හේනේ

6. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ නූර්ති නිෂ්පාදකයන්ගේ නම් සඳහන් පිළිතුර තෝරන්න.
   1. ජෝන් ද සිල්වා, එම්.ජී. පෙරේරා, චාර්ල්ස් ඩයස්
   2. ඩබ්.බී. මකුලොලුව, එම්.ජී. පෙරේරා, පිළිප්පු සිංඤෝ
   3. සී දොන් බස්තියන්, පීටර් ද සිල්වා, ජෝන් ද සිල්වා
   4. චාර්ල්ස් ඩයස්, ජෝන් ද සිල්වා, සී දොන් බස්තියන්

7. රාගයකට අවම වශයෙන් ස්වර,
   1. 4ක් වත් තිබිය යුතු ය. 2. 5ක් වත් තිබිය යුතු ය. 3. 6ක් වත් තිබිය යුතු ය. 4. 7 ක් වත් තිබිය යුතු ය.

8. කෝඩ්ස් වාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩ ඇතුළත් පිළිතුර වනුයේ,
   1. විදුලි ඕගන්, ගිටාර්, වයලීනය 2. ගිටාර්, එකෝඩියන්, විදුලි ඕගනය
   3. ගිටාර්, මෙලෝඩිකා, මැන්ඩලීන් 4. සිතාර්, ගිටාර්, විදුලි ඕගන්

9. |x-x|x-xx|x-x| xx - x| මෙම රිද්ම රටාව මත වාදනය කළ හැකි හින්දුස්ථානී තාලය වනුයේ,
   1. ත්‍රිතාලය 2. ජප් තාලය 3. දීප්චන්දි තාලය 4. ලාවනී තාලය

10. මේ අතරින් තාල වාදනය සඳහා යොදා නොගන්නා භාණ්ඩය වන්නේ,

1. කොන්ගෝ ඩ්‍රම් 2. කහෝන් 3. දර්බක් 4. ට්‍රම්පට්

11.  මෙම සංකේතයෙන් කියැවෙන්නේ පෙරදිග ක්‍රමයට,

1. නි̲ ස්වරයයි 2. නි ස්වරයයි 3. නි̣ ස්වරයයි 4. නි̣̲ ස්වරයයි

12. ග-ම/ප-ග/ම-ග/රි--/යන පෙරදිග ස්වරපාදය බටහිර ක්‍රමයට පෙරලූ විට ලැබෙන පිළිතුර වන්නේ,

1. 

2. 

3. 

4. 

● **අංක 13 සිට 16 තෙක් ප්‍රශ්න සඳහා පහත සඳහන් තාල හා තිත් ඇසුරින් පිළිතුරු සපයන්න.**

A ධ ධි නා|ධා තු නා |

B දො ං|ජි ං ත|ග ත|දො ං ත |

C ධා ධිං ධිං ධා|ධා ධිං ධිං ධා|ධා තිං තිං|තා තා ධිං ධිං ධා |

D දො දො ං ත|ත කු දො ං |

13. D හි තාල පදය අයත් තිත වනුයේ,

1. සුළු තනි තිත 2. මහ තනිතිත 3. සුළු මැදුම් දෙතිත 4. මැදුම් මහ දෙතිත

14. සසර වසන තුරු ... ගීතයට වැයීමට සුදුසු තාලය වනුයේ,

1. A 2. B 3. C 4. D

15. B හි මාත්‍රා කැටි වනුයේ,

1. |1 2 3|1 2 3 4| 2. |1 2|1 2 3| 3. |1 2 3 4|1 2 3 4| 4. |1 2 3|1 2 3|

16. A C වැයීමට හා B D වැයීමට සුදුසු භාණ්ඩ පිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ,

1. ගැටබෙරය හා තබ්ලාවයි. 2. තබ්ලාව හා ගැටබෙරයයි.

3. තබ්ලාව හා මද්දලයයි. 4. තබ්ලාව හා පහතරට බෙරයයි.

● **නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

(බැලෝව / C Major / 7/4 Rhythm / G Major)

17. ............................... ස්කේල් (scale) වාදනය කරන විට ලැබෙන විකෘති ස්වරය වනුයේ ම́ ස්වරයයි.

18 සර්පිනාවක සුළං නිපදවා ගනු ලබන්නේ ............................ මගිනි.

19. .................................... කෝඩ් (chord) එකට අයත් ස්වර වන්නේ ස ග ප යන ස්වරයි.

20. දීප්චන්දි තාලයේ මිශ්‍රමත් කැටි වන ආකාරය පෙන්නුම් කරන බටහිර සංගීත තාල සංකේතය වනුයේ,
............................................. ය.

(ලකුණු 2X20 = 40)

# II කොටස

● **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න දෙකකට පිළිතුරු ලියන්න.**

1. පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| | A | B |
|---|---|---|
| ආරෝහණ | 1 ....................................................... | ස රි ග ම ප ධ නි ස් |
| අවරෝහණ | ස් ධ ප ග රි ස | 4 ....................................................... |
| ජාතිය | ඖඩව | 5 ....................................................... |
| වාදී | 2 ....................................................... | ධෛවතය |
| සංවාදී | ධෛවතය | 6 ....................................................... |
| ගානසමය | 3 ....................................................... | දිවා ප්‍රථම ප්‍රහරය |


i. A හා B අක්ෂරවලින් හඳුන්වන රාග නම් කරන්න. (ලකුණු 4)

ii. එම රාගවලට අයත් තොරතුරු යොදා හිස්තැන් පුරවන්න. (ලකුණු 6)

iii. එම රාග දෙකෙන් ඔබ කැමති රාගයක සර්ගම් ගීතයේ හෝ මධ්‍යලය ගීතයේ ස්ථායී කොටස පමණක් නියමිත තාල සංඥා යොදා ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 6)

iv. ඔබ ලියූ රාගයට අදාළ රාගාංග ඇතුළත් ස්වර ඛණ්ඩ හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)

2. පහත සඳහන් ස්වර පුවරුව උපයෝගී කොටගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. ඉහත ස්වර පුවරුවෙහි මධ්‍යම භාවයේ ස්වර සප්තකයට අයත් වන අංක පිළිවෙලින් ලියා දක්වන්න. (ලකුණු 6)

ii. එම සප්තකය බටහිර සංගීතයේදී හඳුන්වන්නේ කුමන නමකින් ද? (ලකුණු 4)

iii. | ග ප ධ නි | ස් - ධ ප | ම ග ම රි | ස රි ස - | මෙම ස්වර පංචම භාවයට හරවා නැවත ලියා දක්වන්න. (ලකුණු 6)

iv. මෙම සංකේත හඳුන්වන බටහිර නාමයන් නැවත ලියා දක්වන්න.



(ලකුණු 4)

3. I. නව නාට්‍ය කලාවේ ආරම්භය සනිටුහන් වන වර්ෂය හා ඊට පුරෝගාමී වූ පුද්ගලයාගේ නම ලියන්න. (ලකුණු 4)


II. නව නාට්‍ය 4 ක් නම් කරන්න. එම නාට්‍යවල ඇතුලත් ගීතය බැගින් නම් කරන්න. (ලකුණු 8)

III. ඔබ උගත් නව නාට්‍ය ගීතයක කොටසක් ලියන්න. (ලකුණු 4)

IV. ඔබ උගත් ගීත නාට්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 4)

4. i. පහත දී ඇති දත්තයන් උපයෝගී කොටගෙන බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණයට අදාළ ඡාල සටහන සම්පූර්ණ කරන්න.

( percussion / plucking / Double reed / String / Brass wind / reed less)




(හිස්තැනකට ල. 1 බැගින් ලකුණු 6)

ii. ඉහත වර්ගීකරණයේ ඇති තත් (String) වර්ගයට අයත් සංගීත භාණ්ඩ තුනක් නම් කරන්න. (ලකුණු 3)

iii. ඔබ නම් කරන ලද භාණ්ඩ අතරින් කැමැති භාණ්ඩයක දළ රූප සටහනක් ඇඳ එහි කොටස් හතරක් නම් කරන්න. (ලකුණු 4)

iv. ඉහත භාණ්ඩයට අදාළ තත් මත ස රි ග ම ප ධ නි යන ස්වර 7 පිහිටන අයුරු පමණක් පැහැදිලි සටහනකින් දක්වන්න. (ලකුණු 7)

5. පහත ගී ඇසුරින් පිළිතුරු සපයන්න.

A රන්වන් කරල් සැලෙයි සන්සුන් කමින් බරව

B ඇසේ මතුවන කඳුළු බිඳු ගෙන ඔබේ සිරිපා දොවන්නම්

i. ඉහත A හා B ගීත ගැයෙන තාල හඳුනාගෙන A,B ඉදිරියෙන් ලියා දක්වන්න. (ලකුණු 4)

ii. ඒ අතුරින් ඔබ වඩාත් කැමති ගී පාදයක් තෝරාගෙන එය නියමිත තාලයට අනුව පද ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)

iii. ඉහත තාලවලින් එක් තාලයක් නියමිත තාලසංඥා සහිතව ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 6)

iv. ඔබ ලියූ එම තාලයට සමාන උඩරට බෙරපදය නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 6)

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය

## පෙරදිග සංගීතය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. 1 | 2. 2 | 3. 2 | 4. 4 | 5. 1 | 6. 4 | 7. 2 | 8. 2 | 9. 3 | 10. 4 |
| 11. 1 | 12. 2 | 13. 2 | 14. 1 | 15. 2 | 16. 2 | 17. G major | | 18. බැලෝව | |
| 19. C major | 20. 7/4 | | | | | | | | |

(ලකුණු 2 බැගින් 2 x 20 = 40)


### II කොටස

01. i. A භූපාලි B බිලාවල් (ලකුණු 4)
    ii. 1. ස රි ග ප ධ ස් 2. ගාන්ධාරය 3. රාත්‍රී ප්‍රථම ප්‍රහරය
    4. ස් නි ධ ප ම ග රි ස 5. සම්පූර්ණ 6. ගාන්ධාරය (1 බැගින් ලකුණු 6)
    iii. ස්ථායී කොටස නිවැරදිව ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න (ලකුණු 6)
    iv. රාගාංග ලකුණු නම් කිරීම. (ලකුණු 4)

02 i. 1 3 5 6 8 10 12 (ල.6)
   F major scale (ල.4)
   ii. | නි රි ග ම් | ප - ග රි | ස් නි ස ධ | ප ධ ප - | (ලකුණු 6)
   ඩොටඩ් මිනිම්, ෂාප් (sharp), Time signature, Flat (ලකුණු 1)

03. i. 1956 මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා (ලකුණු 4)
    ii. නාට්‍ය 4 ක් ලියා ඇත් නම් ලකුණු පිරිනමන්න (ලකුණු 8)
    iii. ගීත කොටසට ලකුණු පිරිනමන්න (ලකුණු 4)
    iv. දෙපානෝ/ ප්‍රේමතෝජායති සෝකෝ (වෙනත්) (ලකුණු 4)

04. (percussion, plucking, Double reed, string, Brass wind, reed less)




i. හිස් තැන් පිරවීමට (ලකුණු 6)
ii. නම් කර ඇති ආකාරයට ලකුණු දෙන්න. (ලකුණු 3)
(වයලීනය/වියොලා/සෙලෝ/ඩබල් බේස්/ ගිටාර්/ ඉංග්‍රිලිෂ් මැණ්ඩලීන්)
iii. රූප සටහන ඇඳ කොටස් නම් කිරීමට (ලකුණු 4)
iv. තත මත ස්වර හත පිහිටීම දක්වා ඇත්නම් (ලකුණු 7)

05. i. 1 A ජප් තාලය
    B දීප්චන්දි තාලය (ලකුණු 4)
    ii. A රන් | වන්ක | රල් | සැලෙයි
    B ඇසේ S | මතුවෙන | කඳුළු | බිඳුගෙන (ලකුණු 4)
    iii. තාල ප්‍රස්තාර කර ඇත්නම් ලකුණු පිරිනමන්න (ලකුණු 6)
    iv. බෙර පදය ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න (ලකුණු 6)